**විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතිය - 2020**

විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන සහය ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3409-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විදුලි බලය සැපයීමේ හා බෙදාහැරීම් පද්ධතිවල කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයබව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 23,069කට සමාන එජඩො මිලියන 160.20ක් වන අතර ඉන් රු.මිලියන 16,560කට සමාන එජඩො මිලියන 115ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 6,508.8කට සමාන එජඩො මිලියන 45.2ක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කරන ලද අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස

බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

]

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන ගැටලු | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | නයනතිවු යෝජිත බලාගාර සඳහා ඉඩම මිලදී ගැනීම සඳහා කරන ලද ගෙවීම සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගෙන නොතිබුණි. | 2.86 | ඉඩම අත්පත් කර ගැනීම සම්පූර්ණ වන තෙක් ඉඩම මිලදී ගැනීමට දරන ලද රු. 2,860,000ක මූලික වියදම කෙරීගෙන යන වැඩ ගිණුමේ වාර්තා කර ඇත. | නිවැරදි ගිණුම්කරණ ක්‍රමය යොදාගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය සඳහා අදාළ ඉඩම මිලදී ගැනීම හඳුනාගැනීමෙන් පසු ඉඩම තක්සේරු කිරීමට සහ මැනීම සඳහා දරන ලද ගෙවීම් ජංගම නොවන වත්කම් යටතේ වාර්තා කර නොතිබුණි. ඒ වෙනුවට මෙම මුදල ප්‍රාග්ධන වියදම් ලෙස සලකා තිබුණු අතර කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | 0.76 | පැකේජ 4 හි ඉදිකිරීම් සඳහා දරන ලද මුළු පිරිවැය පැකේජ 4 නිමකිරීමත් සමග ප්‍රාග්ධනිත කරනු ලැබේ. | නිවැරදි ගිණුම්කරණ ක්‍රමය යොදාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කෙරීගෙන යන වැඩ ප්‍රකාශය යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස මුදලක් වාර්තා කර ඇත. විගණනය වෙත උපකාරක ලියවිලි ලබා නොදීම හේතුවෙන් වියදමේ වර්ගය/ස්වභාවය සත්‍යාපනය කරගත නොහැකි විය. | **163.23** | **2020** වර්ෂය සඳහා **2021.05.13** දින මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සමග සියලුම උපකාරක ලියවිලි ජාතික විගණන කාර්යාලය වෙත ලබාදී ඇත. | වත්කම් සහ වගකීම්වල පැවැත්ම තහවුරු කර ගැනීමට විගණනයට සාක්ෂි තිබිය යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති අරමුදල්වලින් මිලදී ගන්නා ලද ලී බඩු, සවිකිරීම හා උපකරණ සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගෙන නොතිබුණි. | **0.17** | ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්තිය අනුව, ලී බඩු, සිවිකිරීම් සහ උපකරණ මත රු. **30,000** වඩා අඩුවෙන් දරන ඕනෑම වියදමක් පිරිවැයක් ලෙස සලකන අතර ප්‍රාග්ධනිත නොකරයි. | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපත්තිය හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | ලංකා විදුලිබල මණ්ඩලය මගින් යොදන ලද ප්‍රාග්ධනය පිළිබඳව ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි විගණනය වෙත ලබා දී නොතිබුණි. | **305.60** | **2021.07.28** දින ලං.වි.ම විසින් යොදන ලද ප්‍රාග්ධනය සඳහා උපලේඛණය විගණනයට ඉදිරිපත් කර තිබේ. | ව්‍යාපෘතිය විගණකවරුන් වෙත ප්‍රමාණවත් සහ සුදුසු සාක්ෂි ලබා දිය යුතුය. |
| (ඊ) | විනිමය ලාභය සහ අලාභය මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ වෙනම දැක්වීම වෙනුවට පොළී සහිත ණය යටතේ දක්වා තිබුණි. | **14.71** | **2020/12/31** මූල්‍ය ප්‍රකාශනවල විනිමය ලාභය/අලාභ ගිණුමේ ඊ-**8300** වෙනම හෙළිදරව් කර ඇත. | භාවිත කරන පාර්ශවයන් වෙත නිවැරදි තොරතුරු සැපයීමට අනාවරණයන් සිදුකළ යුතුය. |

**2.2** නිරවුල් නොවුණු ශේෂයන්

| ලෙජර ගිණුම් | මුදල | නිරවුල් නොවුණු කාලය | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | රු.මිලියන | | | |
| **2020** දෙසැම්බර් **31** දිනට පෞද්ගලික සමාගම් දෙකකට ගෙවිය යුතු මුදල වර්ෂ **2** වඩා වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි. | **25.22** | වර්ෂ **2** වැඩි | ගැටලු නිරාකරණය කිරීමේ සාකච්ඡා සඳහා කාලය ගැනීම හේතුවෙන් ප්‍රමාදය සිදුවිය. | ප්‍රමාද භානි අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**2.2** **නීති,රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) | මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශය නිකුත් කරන ලද 2018 සැප්තැම්බර් 18 දිනැති අංක පීඊඩී/01/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ව්‍යාපෘතියේ අවශ්‍යතා පැහැදිලිව හඳුනාගැනීමකින් තොරව ව්‍යාපෘතිය සඳහා sport utility වාහන දෙකක් සහ රෝද හතරෙන් බලගැන්වෙන වාහන (four-wheel driven cabs) දහසයක් පිළිවෙලින් රු.මිලියන 46.8ක් හා රු. මිලියන 153.5ක පිරිවැයකට මිලදී ගෙන තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතුවලට වෙන්කිරීමට ලං.වි.ම වාහන නොමැති අතර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ස්ථාපනය කර ඇති කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව ව්‍යාපෘතියේ විෂය පථය යටතේ සමහර වාහන සපයා ඇත. | චක්‍රලේඛ උපදෙස් සමග අනුගත වීම අවශ්‍ය වේ. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ව්‍යාපෘති සමාලෝචන කමිටු පිහිටුවා නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘති සමාලෝචන කමිටු ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක පීඊඩී/ආර්ඊඩී/03/03/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ 3.1.7 සහ 3.2.7 වගන්තිවල සඳහන් විධිවිධාන | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොමැති අතර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමට අවශ්‍ය වේ. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශ සමස්ථ විගණනයන් සිදුකරන අතර ලං.වි.ම යේ සෑම ව්‍යාපෘතියක් සඳහාම අභ්‍යන්තර විගණනවරු පත් නොකරයි. | ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශ මගින් ව්‍යාපෘතිවල ගණුදෙනු විගණනය කළ යුතුය. |
| (ඉ) | ආ.සං.බැ අවශ්‍යතා | ණය ගිවිසුම අත්සන් කර මාස 3ක් තුළ බඳවාගත යුතු පූර්ණ කාලීන අරමුදල් කළමනාකරණ තනතුර විගණන දිනය වන විටත් බඳවා ගැනීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් කළමනාකරණ අංශය ස්ථාපනය කර තිබුණි. ලංකා විදුලිබල මණ්ඩලයේ සෑම ව්‍යාපෘතියක් සඳහාම අරමුදල් කළමනාකරණ තනතුර පත් නොකරයි. | ආ.සං.බැ අවශ්‍යතා සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල VIII ඡේදයේ 27.1 වගන්තිය | ව්‍යාපෘතිය විසින් ප්‍රමාද හානි ඉල්ලීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමාදවී සැපයීමේ ගාස්තු ලෙස සදහන් කරන ලද ශේෂ දෙක පිළිබද සැලකා බැලීමට බෙදාහැරීමේ අංශ 02 පියවර ගෙන ඇති අතර 2021 මූල්‍ය වර්ෂයේදී වාර්තා කරනු ලැබේ. ගැටලු නිරාකරණය කිරීමේ සාකච්ජා සදහා කාලය ගැනීම නිසා ප්‍රමාදයන් සිදුවී ඇත. | කොන්ත්‍රාත් කොන්දේසි සමග අනුකූල වීම අවශ්‍ය වේ. |

3. භෞතික කාර්යසාධනය
------------------------

3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව මූල්‍ය හා භෞතික ප්‍රගතිය
-----------------------------------------------------------

ණය ගිවිසුමට අනුව, සුළං, සූර්ය, කාර්යක්ෂම ඩීසල් ජෙනරේටර් සහ බැටරි ගබඩාවලින් සමන්විත දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම සහ උතුරු පළාතේ යාපනය ප්‍රදේශයේ ඇනලතිවු, ඩෙල්ෆ් සහ නයිනතිවු කුඩා දූපත් තුනෙහි ග්‍රාමීය ජනතාවගේ කාර්යක්ෂම බලශක්ති භාවිතය සඳහා සහයවීම, ග්‍රාමීය විදුලි සැපයුම් ජාල පුළුල් කිරීම සහ බෙදාහැරීම් කාර්යසාධනය නියාමනය ඇතුලුව මධ්‍ය වෝල්ටීයතා ජාලයෙහි විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සහ පන්නිපිටිය සහ බියගම පවතින කොටුමා උපපොළවල්වල සම්ප්‍රේෂණ පද්ධතියේ ප්‍රතික්‍රියාකාරී බල කළමනාකරණය වැඩිදියුණු කිරීම වැනි ප්‍රධාන සංරචක 04ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, සැලසුම් කළ දිනය වූ 2016 ජූලි 31 දින සිට වර්ෂයක සැලකිය යුතු කාලපරිච්ඡේදයක ප්‍රමාදයන් සහිතව අදාළ කටයුතු ආරම්භ කර තිබුණු අතර ප්‍රමාදයන් ආවරණය කරගැනීමට පියවර ගැනීමකින් තොරව මෙහෙයුම් කටයුතු සිදුකර තිබුණි.

3.2 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/නිමකිරීමේ ප්‍රමාදයන්
-----------------------------------------------------------------------------------

| | සංරචකයන් | ආරම්භ කිරීමට/ක්‍රියාත්මක කිරීමට/නිමකිරීමට සැලසුම් කළ දිනය | ආරම්භ කිරීම/ක්‍රියාත්මක කිරීම/නිමකිරීම කළ දිනය | ප්‍රමාදය | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | ---------- | ------------- | --------- | -------- | ------------- | ---------- |
| (අ) | ඇනලතිවු, ඩෙල්ෆ් සහ නයනතිවු යන කුඩා හුදකලා දූපත් තුනක දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, උතුරු පළාතේ ඇනලතිවු, ඩෙල්ෆ් සහ නයනතිවු දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2016 තුන්වන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වූ අතර කොන්ත්‍රාත්තුවේ කටයුතු 2017 | කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට නයනතිවු හි ඉඩම පමණක් මිළදී ගෙන තිබුණි. | ප්‍රදානය කිරීමට සැළසුම් කළ දින සිට වර්ෂ 4 1/2 වඩා වැඩි සහ ව්‍යාපෘති පරිපාලන අත් පොතට අනුව, කටයුතු ආරම්භ කිරීමට සැළසුම් කළ දින සිට වර්ෂ 3 ¼ වඩා වැඩි කාලයක් | ක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව SCAPC වෙත ඉදිරිපත් කර ඇති අතර කමිටුවේ තීරණය බලාපොරොත්තු වෙන් සිටී. එම නිසා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාදවේ. | තව දුරටත් ප්‍රමාද කිරීමකින් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පියවර ගත යුතුයි. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | හතරවන කාර්තුවේ ආරම්භ කිරිමට සැලසුම් කර තිබුණි. | | | | |
| (ආ) | මධ්‍ය වෝල්ටීයතා ජාලයේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ඇස්තමේන්තුගත වටිනාකම එ.ජ.ඩො.මිලියන 34.99ක කිලෝමීටර 270.5ක් දිග කිලෝවොට් 33 කුළුණු රැහැන් සහ කිලෝවොට් 33 සහිත ගැන්ට්‍රි 13 ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2016 වර්ෂයේ තුන්වන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වූ අතර කොන්ත්‍රාත්තුවේ කටයුතු 2017 හතරවන කාර්තුවේ ආරම්භ කිරිමට සැලසුම් කර තිබුණි. | කොන්ත්‍රාත්තුව එ.ජ.ඩො. මිලියන 40.48 පිරිවැයකට 2019 මැයි 30 දින ප්‍රදානය කර තිබුණු අතර මෙම කොන්ත්‍රාත්තුවේ බලපැවැත්වෙන දින 2019 ජුලි 6 විය. | ප්‍රදානය කිරීමට සැළසුම් කළ දින සිට වර්ෂ 2 1/2 වඩා වැඩි සහ ව්‍යාපෘති පරිපාලන අත් පොතට අනුව, පැකේජ 4 හි කටයුතු ආරම්භ කිරීමට සැළසුම් කළ දින සිට වර්ෂ 3 වඩා වැඩි කාලයක් | රටේ පැවති කොවිඩ් වසංගත ව්‍යාප්තිය සහ අයහපත් කාලගුණය නිසා කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය සැලකිය යුතු ලෙස අඩුවෙන් වාර්තා විය. | තව දුරටත් ප්‍රමාද කිරීමකින් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පියවර ගත යුතුයි. |
| (ඇ) | වැඩිදියුණු කළ සම්ප්‍රේෂණ පද්ධතියේ ප්‍රතික්‍රියාකාරී බල කළමනාකරණය | කොන්ත්‍රාත්තුව 2017 වර්ෂයේ පළමුවන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වූ අතර කොන්ත්‍රාත්තුවේ කටයුතු 2018 දෙවන කාර්තුව වනවිට ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. | | | | |

| | | | | |
|---|---|---|---|---|
| ලොට් 1: පන්නිපිටිය කොටුමා උපපොළෙහි MVAr Breaker Switched Capacitor 100ක් ස්ථාපනය | කොන්ත්‍රාත්තුව එ.ජ.ඩො.මිලියන 1.5ක්, යුරෝ මිලියන 3.76 සහ රු.මිලියන 166.05 ඇස්තමේන්තුගත පිරිවැයකට 2019 මැයි 09 දින පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්තුවේ කටයුතු 2019 අගෝස්තු 01 දින ආරම්භ කර තිබුණි. | ප්‍රදානය කිරීමට සැළසුම් කළ දින සිට වර්ෂ 2 වඩා වැඩි සහ ව්‍යාපෘති පරිපාලන අත් පොතට අනුව, කටයුතු ආරම්භ කිරීමට සැළසුම් කළ දින සිට වර්ෂයකට වඩා වැඩි | අත්තිකාරම් ගෙවීම සහ එල්සී විවෘත කිරීම වැනි පූර්ව අවශ්‍යතා සපුරාලීමෙන් පසු බලාත්මක දිනය දෙන ලදී. ඇස්තමේන්තු සඳහා සහ ලංසු මිළ සමග විශාල වෙනස්කම් පැවතීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුවේ සාකච්ජා ගණනාවක් පැවතුණි. | තව දුරටත් ප්‍රමාද කිරීමකින් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පියවර ගත යුතුයි. |
| ලොට් 2: බියගම කොටුමා උපපොළෙහි Static Var System (SVS) පද්ධති ස්ථාපනය | කොන්ත්‍රාත්තුව 2020 මැයි 28 දින පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්තුවේ කටයුතු 2020 ඔක්තෝබර් 08 දින ආරම්භ කර තිබුණි. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කළ දිනට වර්ෂ 03කට වඩා වැඩි කාලයක් | කොන්ත්‍රාත්තුව 2020.03.28 දින පිරිනමා තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්තුව 2020.07.07 දින අත්සන් කළ අතර 2020.10.08 දින සිට බලාත්මක වේ. | තව දුරටත් ප්‍රමාද කිරීමකින් තොරව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පියවර ගත යුතුයි. |

### 3.3 ඌනඋපයෝජිත සම්පත්

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්කවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 2,592 කට සමාන එ.ජ.ඩො මිලියන 18ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, එදිනට එම ඉලක්කයෙන් සියයට 42.56ක් නියෝජනය කරන රු. මිලියන 1,103.17ක මුදලක් පමණක් උපයෝජය කර තිබුණි. | රටේ පැවති කොවිඩ් වසංගත ව්‍යාප්තිය සහ අයහපත් කාලගුණය නිසා කොන්ත්‍රාත්තුවේ කාර්යසාධනය සැලකිය යුතු ලෙස අඩුවෙන් වාර්තා විය. එම නිසා අපේක්ෂිත ව්‍යාපෘති ඉලක්ක අත්කර ගෙන නොමැත. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්ක සමඟ අනුගත වීම අවශ්‍ය වේ. |

**3.4 නොවිසඳී පැවතුණු පෙර විගණන වාර්තාවල පෙන්වා දෙනු ලැබූ ගැටලු**

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් ප්‍රමාද හානි ඉල්ලීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය තුළදී බෙදා හැරීමේ අංශ 02 මගින් ප්‍රමාද හානි ඉල්ලා තිබුණි.කොන්ත්‍රාත්කරුවන් සමගගැටලු නිරාකරණය කිරීමේ සාකච්ඡා පැවතීම හේතුවෙන් ප්‍රමාද විය. | කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද හානි අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති තොග ශේෂයන් පළාත් ගබඩාවලදී හඳුනාගත නොහැකි විය. | ඉල්ලීම පරිදි, තොග ශේෂයන් සත්‍යාපනයෙන් පසු බෙදාහැරීම් අංශය 02 මගින් ජාතික විගණන කාර්යාලය වෙත වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති තොග ශේෂයන් හඳුනාගත යුතුය. |
| (ඇ) | ණයහිමියන්ගේ දිගු කාලීන ගෙවිය යුතු ශේෂයන් | 2021 වර්ෂය තුළ ප්‍රමාද හානි ඉල්ලීමෙන් බෙදා හැරීමේ අංශ 02 මගින් දිගුකාලීන ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කර ඇත. | ණයහිමි ශේෂයන් කාලීනව සංසන්දනය කළ යුතුය. |

**3.5 පරිබාහිර කටයුතු**

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මෝටර් වාහන 18 අයිතිය කොන්ත්‍රාත්කරුගේ නමට පැවතීම හේතුවෙන් 2016 සිට 2020 දක්වා කාලය තුළ ණය මුදලින් රුපියල් මිලියන 20.3ක පිරිවැයකට මිළදී ගත් මෝටර් වාහන 18ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගිණුම්ගත කර නොතිබුණි. තවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත අයිතිය මාරු කිරීමට හා ඒ සඳහා දත්ත සමුදායක් පවත්වා ගැනීමට පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් ගිවිසුමට හා ලංසු අංක සීර්බී/පීඑම්යු/එස්ඊඑස්ආර්අයිපී/2017/අයිසීබී/01 ලංසු ලියවිලි අනුව, මෙම වාහන කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලැබේ. එම නිසා SESRI ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට (පැකේජ 4,5 සහ 6) වාහන ආනයනය හෝ ඍජු මිළදී ගැනීමට බලය නොමැති අතර අනුමත ලිපිය විගණය වෙත ඉදිරිපත් කර ඇති අතර පිටපත් මේ සමග අමුණා ඇත. | ලංකා විදුලිබල මණ්ඩලයට අවධානම අඩුකර ගැනීම සඳහා කොන්ත්‍රාත් ලියවිලිවල වගන්ති සකස් කළ යුතුය. |
| (ආ) | අයිතිය දැනටමත් කොන්ත්‍රාත්කරු සතු වීම හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (රාජගිරිය) පවරන ලද 2020 ජනවාරි 28 දින ණය මුදලින් මිළදී ගන්නා ලද අවුඩි මෝටර් කාර් රථය මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ ගිණුම්ගත කර නොතිබුණි. | 2020.12.31 දිනට මෙම වාහන කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනෙවලට ගෙන ඇත. ව්‍යාපෘතිය අවසන් කර ලං.වී.ම භාර දීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ යටතේහඳුනාගත හැකි අතර ඉන් පසුව ක්ෂය කිරීම් ආරම්භ කරනු ලැබේ. | ලංකා විදුලිබල මණ්ඩලයට අවධානම අඩුකර ගැනීම සඳහා කොන්ත්‍රාත් ලියවිලිවල වගන්ති සකස් කළ යුතුය. |